# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

### 2023 ඔක්තෝබර්

### මානවශාස්ත්‍ර පීඨය

## නාට්‍ය හා රංගකලාව

### ශ්‍රී ලංකාවේ යාතු කර්ම සහ ගැමි නාට්‍ය - DMAT 18224

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. යටත් පිරිසෙයින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරාගෙන ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

<u>පළමු කොටස</u>

01. අ) යාතුකර්ම (Ritual) යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 05)

ආ) දේශීය යාතුකර්ම පැවැත්වීමේ අරමුණු උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 15)

02. අ) උඩරට ශාන්තිකර්ම මොනවාද? නම් කරන්න. (ලකුණු 05)

ආ) සිය අරමුණු ඉටු කර ගැනීම උදෙසා උඩරට ශාන්තිකර්ම ශිල්පීන් භාවිත කර ඇති නාට්‍යමය උපක්‍රම නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 15)

03. අ) රට යකුම ශාන්තිකර්මයේ ඇති නාට්‍යමය උපක්‍රම මොනවාද? (ලකුණු 05)

ආ) නාට්‍යමය උපක්‍රම භාවිත කරමින් රටයකුම ශාන්තිකර්මකරුවා සිදු කරන්නේ 'අධ්‍යාපනික සන්නිවේදන කාර්යයක් සිදු කිරීම' ය. මෙම මතය සනාථ කරන්න. (ලකුණු 15)

04. ධාර්මික කරුණු සමාජගත කිරීම සඳහා බෞද්ධ පූජාකර්ම නාටකීයව ඉදිරිපත් කර ඇති ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 20)

<u>දෙවන කොටස</u>

05. අ) කෝලම් නාටකයේ නිරූපණය කෙරෙන චරිත වර්ග උදාහරණ සහිත ව පෙන්වා දෙන්න. (ලකුණු 08)

ආ) කෝලම් නාටකයේ ප්‍රභවය පිළිබඳ ඇති මතවාද විමසන්න. (ලකුණු 12)

06. රංග ශෛලිය කෙරේ අවධානය යොමු කරමින් කෝලම් සහ සොකරි යන ගැමි නාටක අතර ඇති වෙනස්කම් මොනවාද? උදාහරණ සහිත ව පෙන්වා දෙන්න. (ලකුණු 20)

07. සිංහල ගැමි නාටක අතර නාඩගම් සුවිශේෂී වන්නේ කවර ලක්ෂණ පදනම් කරගෙනද? උදාහරණ සහිත ව පෙන්වා දෙන්න. (ලකුණු 20)

08. අ) ගැමිනාට්‍ය සහ සම්භාව්‍ය නාට්‍ය අතර ඇත්තේ කවර වෙනසක් ද? (ලකුණු 08)

ආ) ගැමිනාට්‍ය මගින් විශද කෙරෙන්නේ පූජාර්ථපූර්ණ සෞන්දර්යයකි. විමසන්න. (ලකුණු 12)

*********************************